# ස්තූපාකෘතිවලින් පිළිඹිබු වන සංකේතාර්ථ පිළිබඳ විමර්ශනයක්

කෝවානේ චන්දිම හිමි[1], පානදුරේ දුමින්දාලංකාර හිමි[2]
ආර්.ආර්.ආර්.පී.ඩබ්.ඒ.එස්. රන්තිලක[3]

ස්තූපය යනු බෞද්ධයන්ගේ අතිශය පූජනීයත්වයට පත් ශාරීරික ධාතු තැම්පත් ගෘහයකි. ස්තූප නිර්මාණය බුද්ධ කාලයට පෙර සිදු වූවකි. ස්තූපය බෞද්ධ කලා නිර්මාණ අතර ඓතිහාසික වශයෙන් වඩාත් වැදගත් වූවකි. බුද්ධ පරිනිර්වාණයෙන් පසු දෝණ බමුණා විසින් දෙනු ලැබූ ශාරීරික ධාතු තැම්පත්කර ස්තූප සෑදීම දඹදිව ප්‍රාන්තවල සිදු කෙරුණි. සාංචි, බුද්ධගයා, මථුරා ආදී තැන්වල නිමවා ඇති රූ කම්වලින් ඒ බව පැහැදිලි වේ. ඉන්දියාවේ හිල්සා ප්‍රදේශයට අයත් සාංචි, යෝනාරී, සතධාරා වැනි ස්ථානවල පුරාවිද්‍යාත්මක සාධකවලින් පැරණි ස්තූප සැලසුම් විධි හඳුනාගත හැකිය. බෞද්ධ කලාව තුළ නිර්මාණය වූ ස්තූපයේ ආකෘති හයක් පමණ ප්‍රකටව තිබූ බව හඳුනාගත හැකිය. එනම් බුබ්බුලාකාර, ඝණ්ඨාකාර, ධාන්‍යාකාර, ඝටාකාර, ආමලාකාර, පද්මාකාර ආදියයි. ස්තූපාකෘති මගින් බෞද්ධයන් අපූරු සංකල්ප සමුදායක් සන්නිවේදනය කර තිබේ. ''බුබ්බුල'' නම් දිය බුබුලයි. දිය බුබුල ජීවිතයේ අනිත්‍යතාව දැක්වීමට සංකේතාත්මකව භාවිත කළේ බුදුපියාණන් වහන්සේය. ජීවිතය පිළිබඳ මෙම යථාර්ත දර්ශනය සමාජයට සන්නිවේදනය කිරීමට යොදාගත් මේ චමත්කාර නිමැවුම බෞද්ධ මනෝවිද්‍යාවේ අසමසම බව මොනවට කියාපායි. ඝණ්ඨාකාර දාගැබ ඝණ්ඨාවක ආකෘතිය ගත්තකි. යම් සේ යමක් සන්නිවේදනය කිරීම පිණිස සෙනසුනේ (ගෙඩිය), පන්සලේ ගණ්ඨාව නාද කෙරේ ද එසේම ස්තූපය ද ජනයා අතරට දහම් ගණ්ඨාව නාදය කොට අසූහාරදහසක් වූ දහම් කඳ සන්නිවේදනය කරයි. වී ගොඩක ස්වරූපයෙන් ගොඩනැගූ දාගැබ ධන්‍යාකාර දාගැබයි. කෘෂිකර්මාන්තයෙන් දිවි ගෙවන බොදු ජනයාට ධාන්‍ය ගොඩක් දැකීම තරම් අස්වැසිල්ලක් නැත. ඝට යනු කළයයි. කළයෙහි ජලය හෝ යමක් පුරවා තැබූ විට එය කල්ගත වනවිට පල් වන්නේය. බුදුරදුන් ඒ අර්ථය ඇතිව කළය කයට උපමා කර දැක්වීය. ඝටාකාර දාගැබෙක් ජන විඥ්ඥාණයට සන්නිවේදනය කරන්නේ ඒ යථාර්තයයි. ආමලාකාර දාගැබ නෙල්ලි ගෙඩියක ආකෘතිය ගනී. නෙල්ලි ගෙඩියක රස පහක් ඇතැයි කියවේ. එමෙන්ම පුද්ගලයාට ද චක්ෂුරාදී ඉන්ද්‍රිය පසෙන් ලැබෙන රූපාදී අරමුණු නම් වූ රස පහක් ඇත. ඒවාට ගොදුරු වන්නා කෙලෙස් රෝගයෙන් නොමිදෙයි. ජීවිතයේ යථාර්තය විනිවිද දැකීමට ආමලාකාර දාගැබ මඟ කියා දෙයි. පද්මාකාර දාගැබෙන් බුදුරදුන්ගේ පද්මාකාර ජීවිතය ප්‍රකට කරන අතර සැදැහැයෙන් දාගැබ වන්දනා කරන ජනයාට එය පරමාදර්ශයකි. පාරිශුද්ධ ජීවිතයක් ගෙවන්නා පූජාර්හ වන බව ඔවුහු ඉන් මැනවින් වටහා ගන්නේය. මෙම පර්යේෂණය මගින් ස්තූපයේ හැඩය පිළිබදව විමර්ශනය වේ. පර්යේෂණ මූලාශ්‍ර ලෙස ස්තූපය පිළිබද තොරතුරු සදහන් ප්‍රාථමික, ද්විතීයික, තෘතීයික මූලාශ්‍ර අධ්‍යයනය කෙරේ. පර්යේෂණ සීමා ලෙස ශ්‍රී ලාංකේය ස්තූපාකෘති පමණක් අධ්‍යයනය කෙරේ.

**ප්‍රමුඛ පද** : පූජාර්හ, යථාර්තය, සංකේත, ථූපාර්හ, අරමුණු

123 පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.dumindalankarap@gmail.com